සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 13 - 2020

විභාග අංකය ..................................

# නර්තනය (දේශීය) II

කාලය පැය තුනයි

වැදගත්

පළමුවන කොටසේ ප්‍රශ්න 01 හා 02 අනිවාර්ය වේ. II හා III, යන කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

සෑම ප්‍රශ්නයකටම (I) කොටසට ලකුණු 06 ක් ද, (II) කොටසට ලකුණු 06 ක් ද, (III) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් හිමි වේ.

## I කොටස

01. i. පහත සඳහන් බෙර පදය මාත්‍රා 2 +4 තාල රූපයට ප්‍රස්තාර කරන්න.
කුංදඩ කුං ජිං තරිකිට ජිංතක ජිංතක තරිකිට
ii. පහත සඳහන් කවි පද මාත්‍රා 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න.
රන්විල රිද්දි විල කෙළිනා බිසවුන්ට
මැණික් ගඟේ දිය නාලා ගොඩ වෙන්ට
iii. ගොග් ගොග් ජිං ජිංගත වට්ටමේ දෙවන අඩව්ව අදාළ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

02. පුරාවිද්‍යාත්මක හා ලිඛිත සාධක ඇසුරෙන් දේශීය නර්තන කලා ඉතිහාසය අධ්‍යයනය කළ හැකිය.
i. සන්දේශ කාව්‍යය දෙකක් ඇසුරෙන් කෝට්ටේ යුගයේ නර්තන කලාව පිළිබඳ සාධක දෙකක් ඉදිරිපත් කරන්න.
ii. මහනුවර හා ගම්පොළ යුගවල නර්තන කලාව පැවති තත්වය පිළිබඳ දේශසංචාරක වාර්තා දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.
iii. 1930 දශකය හා 1940 දශකය නර්තන කලාව විවිධ පැතිකඩ ඔස්සේ ප්‍රවර්ධනය වූ ආකාරය සාධක 04 ක් ඔස්සේ දක්වන්න.

## II කොටස

03. රංගභූමි අලංකරණය තුළින් දේශීය ශාන්ති කර්මයන්හි විචිත්‍රත්වය වඩාත් ඔප් නැංවී ඇත.
i. කොහොඹා කංකාරියේ එන රංග භූමි සැරසිලි දෙකක් ඇසුරින් ඉහත කියමන විස්තර කරන්න.
ii. රටයකුම ශාන්තිකර්මයේ නානුමුරය පෙළපාලිය තුළ රංග භාණ්ඩ භාවිතය නිරූපණ කාර්යයට දායක වී ඇති අයුරු පැහැදිලි කරන්න.
iii. බලි ශාන්ති කර්මයෙහි දක්නට ලැබෙන ඇඹුම් ශිල්ප ක්‍රම වර්ණ ගැන්වීම, සැරසිලි හා අමුද්‍රව්‍යවල සුවිශේෂත්වය පිළිබඳ විග්‍රහයක් කරන්න.

04. දේශීය ශාන්තිකර්මවල මඩු භූමි සකස් කිරීමේදී මෙන්ම මඩු භූමිය තුල පැවතිය යුතු ආකාරය පිළිබඳව ද සම්මතයන් පවතී.
   i. ශාන්ති කර්ම රඟමඩල හඳුන්වන්න.
   ii. ශාන්ති කර්ම රඟමඩල සකස් කිරීමේ සම්මතයන් පිළිබඳ කොහොඹා කංකාරි මඩුපුරේ ගායනා ඇසුරින් පැහැදිලි කරන්න.
   iii. යක්දෙස්සන් රඟමඩල තුල පැවතිය යුතු පිලිවෙත් පිළිබඳ දක්වා නියමයන් හා ආචාර ධර්ම පිළිබඳ උදාහරණ දක්වමින් විමසුමක් කරන්න.

05. ප්‍රාසාංගික බව වර්ධනයෙහිලා රංග භූමිය අලංකරණය සහ රංග වින්‍යාසය වැදගත් තැනක් උසුලයි.
   i. සොකරි රඟ මඬල විස්තර කරන්න.
   ii. ගැමි නැටුම්වල ප්‍රාසාංගික බව වර්ධනයෙහිලා රංග වින්‍යාසය ඉවහල් කර ගත හැකි ආකාරය පිළිබඳ අදහස් දක්වන්න.
   iii. කෝලම් රංග කාර්යය සඳහා රඟ මඬල තුළ භාවිත වන ශිල්ප ක්‍රම පිළිබඳ විමසුමක් කරන්න.

## **<u>III කොටස</u>**

06.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| උයද ශංකර් | නල දමයන්ති | මකුට |
| ජෝන් ජෝර්ජ් නෝර්වේ | ශාප් මෝචන් | ශෙෝරි |
| රුක්මනීදේවී අරුන්ඩේල් | නට් ක්‍රැකර් | ලෙහෙඟා |
| රවින්ද්‍රනාත් තාගෝර් | කරදිය | ස්කලේෆ් |

   i. (අ) කොටස බැලේ නාට්‍යය ප්‍රවර්ධනයට කැපවූ ශිල්පියා නම්කර ඔහුගේ දායකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.
   ii. ආ - කොටස අවුරෝරා කුමරිය හා සම්බන්ධ බැලේ රංගය නම්කොට එහි කථා තේමාව ලියා දක්වන්න.
   iii. ඉ - කොටස බැලේ රංගවස්ත්‍රාභරණවලට අයත් කොටසක් තෝරා එය චලනවල ස්වභාවය මතුකර දැක්වීම සඳහා ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න.

07. නර්තන අංගයක් නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමේදී රංග ආලෝකය වැදගත් ස්ථානයක් ගනී.
   i. නූතන වේදිකාවේ භාවිතාවන ප්‍රධාන ලාම්පු වර්ග දෙකක් නම් කර හඳුන්වන්න.
   ii. 'වේදිකා ආලෝකකරණයේදී එම ප්‍රසංග අංකය සඳහා භාවිතා වන රංග වස්ත්‍ර පිළිබඳ මනා අවබෝධයක් ආලෝක ශිල්පියා සතු විය යුතුය. මෙය පහදන්න.
   iii. ශාන්තිකර්ම වල පරිහරණය කළ පන්දම් ආලෝකයේ සිට නූතන ආලෝක තත්වයන් තෙක් පරිණාමය වී ඇති ආකාරය විමසන්න.